**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - 2013**
---------------------------------------------------

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3** විගණකගේ වගකීම
--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින්වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) ඉකුත් වර්ෂයේ හඳුනාගන්නා ලද රු.12,379,621 ක් වූ තොග ඌනතාවය සැසඳීමක් කර නිරවුල් කිරීමට කටයුතු නොකර වෙළඳ තොග යටතේ ගිණුම්ගත කර තිබුණි.**

**(ආ) ඉකුත් වර්ෂයට අදාළ අධි ක්ෂය ගැලපීම රු.16,481,659 ක් අතීතානුයෝගීව ගැලපීම් කරනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලින් අඩුකර දක්වා තිබුණි.**

**2.2.2 නොසැසඳූ පාලන ගිණුම්**

**කල්බදු වාහන 12 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂයට අදාළ ගෙවීම්වල එකතුව රු.11,940,280 ක් වූ නමුත්, තහවුරු කිරීම්වලට අනුව ගෙවීම් එකතුව රු.12,249,492 ක් වූයෙන් රු.309,212 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.**

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) බඩ ඉරිඟු ව්‍යාපෘතියට අදාලව 2009 වර්ෂයේ සිට කන්තලේ ලංකා බැංකු ශාඛාවෙන් අයවියයුතු රු.2,092,750 ක් හා බඩ ඉරිඟු බීජ ණය පදනමට ගොවීන්ට ලබා දීමෙන් ගොවීන්ගෙන් අයවියයුතු රු.207,848 ක් අයකරගෙන නොතිබුණු අතර, වියලීම සඳහා ලබාදී තිබුණු බඩ ඉරිඟු ආපසු නොදීම නිසා පෞද්ගලික ආයතනයකින් අයවියයුතු රු.11,194,220 අයකර ගැනීමට නීතිමය පියවර ගෙන තිබුණද, 2014 සැප්තැම්බර් 30 දින වන විටද එම මුදල් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.**

**(ආ) කඳුකර ප්‍රදේශයේ ජනතාවට ගංවතුර සහනාධාර ලෙස ලබා දී තිබුණු රු.1,135,000 ක මුදල රොසිටා ගොවිපලෙන් අයවියයුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අනුව එම මුදල පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයෙන් අයවිය යුතු මුදලක් බව නිරීක්ෂණය විය.**

**(ඇ)** **ප්‍රධාන කාර්යාලයේ හා ගොවිපල 17 ක වසර 4 වඩා පැරණි පිළිවෙලින් රු.10,128,117 ක් හා රු.3,016,255 ක් වූ ණයගැති ශේෂ අයකර ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.**

**(ඈ)** **පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මහවැලි පශු සම්පත් සංවර්ධන සමාගමින් ප්‍රධාන කාර්යාලයට හා ගොවිපල 02 කට ලැබිය යුතු රු.6,261,979 ක් වසර 4 කට වඩා වැඩි කාලයක් පරිශේෂයව පැවතියදී සමාලෝචිත වර්ෂයේදී රු.3,188,202 ක් වටිනා කුකුළු පැටවුන් ණය පදනම මත එම ආයතනයට ලබා දී තිබුණි.**

**(ඉ)** **ගොවිපල 08 ක වර්ෂ 05 ට වඩා පැරණි අයනොවී පැවති කාර්යමණ්ඩල ණයගැති ශේෂය රු.319,517 ක් වූ අතර වර්ෂයකට වඩා පැරණි උත්සව/විශේෂ අත්තිකාරම් එකතුව රු.203,825 ක් විය.**

**(ඊ)** **මුදල් අඩුවීමක් ලෙස රු.53,363 ක මුදලක් කිරි ව්‍යාපෘතියේ ණයගැතියන් යටතේ දක්වා තිබූ නමුත්, ඊට හේතු හෝ ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.**

**(උ)** **බැංකුවෙන් ලබාගත් තහවුරු කිරීම්වලට අනුව කල්බදු ක්‍රමයට ලබාගත් වත්කම් ගිණුම්ගත කිරීමේදී කෙටිකාලීන වගකීම්, දිගුකාලීන වගකීම් හා වත්කම් පිළිවෙලින් රු.29,574 ක්, රු.7,355,663 ක් හා රු.7,385,237 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණු අතර මෙම වෙනසට හේතු හඳුනාගෙන නොතිබුණි.**

## 2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

**පහත සඳහන් නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූලනොවූ අවස්ථා නිරීක්ෂණය විය.**

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | **මුදල් රෙගුලාසි 371 (2)** | **අදාල කාර්යය නිමකළ විගස ලබාගත් අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවද, මණ්ඩලයේ නිලධාරීන් හා විවිධ ආයතන වෙත ලබා දී තිබුණු රු.2,398,229 ක අත්තිකාරම් 2014 දෙසැම්බර් 24 දින දක්වා පියවා නොතිබුණි.** |
| **(ආ)** | **2011 සැප්තැම්බර් 15 දිනැති අංක පීඊඩී 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | **භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සභාපතිවරයාට 2013 ජනවාරි සිට නොවැම්බර් දක්වා ගෙවල් කුළී දීමනා රු.330,000 ක් ගෙවා තිබුණි.** |
| **(ඇ)** | **2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 මාර්ගෝපදේශ** | **නිකවැරටිය ගොවිපලේ නව අලෙවිසැල ඉදිකිරීමේ ඇස්තමේන්තු ගත වටිනාකම අනුව ඒ සඳහා අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගතයුතු වුවත්, එසේ අනුමැතිය ලබා ගැනීමකින්** |

තොරව මෙම ඉදිකිරීමේ කාර්යයන් කොටස් කර කලාපීය සුළු ටෙන්ඩර් මණ්ඩල නිර්දේශය මත ඉදිකිරීම් සිදුකර තිබුණි.

**2.5** ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගොවිපල 08 ක් විසින් ඇස්තමේන්තු මුදල වූ රු.140,912,713 ක් ඉක්මවා රු.73,240,622 ක් විවිධ කාර්යයන් සඳහා වියදම් කර තිබුණි.

**3.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,096,836 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.26,294,245 වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.24,197,409 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. පරිපාලන වියදම් රු.42,452,480 කින් වැඩිවීම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2** ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

ආයතනය විසින් ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් පැහැරහැරීම සම්බන්ධයෙන් බාහිර ආයතන දෙකකට එරෙහිව රු.14,040,395 ක වන්දියක් ඉල්ලා 2011 හා 2012 වර්ෂවලදී අධිකරණවල නඩු දෙකක් ගොනුකර තිබුණු අතර, බාහිර පුද්ගලයින් දෙදෙනෙක් හා මණ්ඩලයේ සේවකයින් 10 දෙනෙකු විසින් සේවය අත්හිටුවීමට එරෙහිව හා ලබාදී තිබෙන අධිකරණ තීරණවලට එරෙහිව නඩු 12 ක් 2001 හා 2013 වර්ෂවලදී ගොනුකර තිබුණි.

**4.** මෙහෙයුම් සමාලෝචනය

**4.1** කාර්යසාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කිරි බෙදාහැරීමේ ව්‍යාපෘතිය යටතේ කිරි අලෙවි කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය මගින් අලෙවිසැල් 116 ක් පවත්වාගෙන ගොස් තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අලෙවිසැල් සංඛ්‍යාව 50 ක් විය. මින් අලෙවිසැල් 16 ක් රු.1,775,671 ක අලාභයක් හා අලෙවිසැල් 34 ක් රු.17,685,720 ක ලාභයක් වාර්තාකර තිබුණි.

(ආ) මණ්ඩලයට අයත් ගොවිපල 15 කින් සමාලෝචිත වර්ෂයේදී රු. 160,334,263 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණු අතර එයින් ගොවිපල 12 ක් 2008 වර්ෂයේ සිටම අලාභ ලබමින් පැවතුණි. කෙසේ වුවද එම ගොවිපලවල් ලාභ ලබන තත්ත්වයට පත්කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඇ) මණ්ඩලයට අයත් මුළු වරලත් අලෙවිසැල් 111 න් අලෙවිසැල් 17 ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර, සමාලෝචිත වර්ෂයේ වරලත් අලෙවිසැල් ව්‍යාපෘතියේ ශුද්ධ අලාභය රු.1,049,282 ක් විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හා ඉඩම් කොමසාරිස් කාර්යාලය සතු පිළිවෙලින් හෙක්ටයාර් 2,887.7 ක් හා 9,728.6 ක් නීත්‍යානුකූල පවරා ගැනීමකින් තොරව මණ්ඩලය විසින් පරිහරණය කරනු ලබන අතර එම ඉඩම් මණ්ඩලයේ වත්කමක් ලෙස 2011 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) වෙලාඩ් ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාගෙන තිබුණු රු.1,682,727,540 (US$12,944,058)ක ණය මුදල ආපසු ගෙවීමේ සැලැස්මක් සකස්කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 2012 නොවැම්බර් 06 දිනැති අංක DE/AUS/06 දරන ලිපිය අනුව 2013 මාර්තු 08 දිනට පෙර හෝ එදින සිට ණය ආපසු ගෙවීම ආරම්භ කළයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද කිසිඳු මුදලක් ආපසු ගෙවා නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය වත්කම්**

ක්‍රියාත්මක නොවන කන්තලේ බඩ ඉරිඟු ව්‍යාපෘතියට අයත් බැංකු ගිණුම් 03 ක් 2010 වර්ෂයේ සිට අක්‍රියව පැවති අතර, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ශේෂය රු.885,470 ක් විය.

**4.4 හඳුනාගන්නා ලද පාඩු**

මණ්ඩලය සතු ගොවිපල 30 ක සිටින සතුන්ගේ උපත් හා මරණ පිළිබඳව තොරතුරු අවස්ථා දෙකකදී මණ්ඩලයේ සභාපතිවරයාගෙන් ඉල්ලුම් කළද ගොවිපල 25 ක තොරතුරු පමණක් ලබාදී තිබුණි. එම ගොවිපල 25 හි රු.12,675,820 ක් වටිනා එළ ගවයින් හා මී ගවයින් 1,071 ක් මියගොස් තිබුණි.

**4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

කන්තලේ සීනි සමාගමට අයත් උක් වගා භූමියෙන් අක්කර 1,000 ක ප්‍රමාණයක් නියමු ව්‍යාපෘතියක් ලෙස බඩඉරිඟු වගා කිරීමට මණ්ඩලයට තාවකාලිකව ලබාදීමටත් ඒ සඳහා චක්‍රීය අරමුදලක් ඇති කිරීමටත් ඉඩමේ උක් වගාව සඳහා සුදුසු ව්‍යවසායකයකු තෝරාගත් විට චක්‍රීය අරමුදලේ ඉතිරි මුදල් මහා භාණ්ඩාගාරයට යොමු කිරීමටත් යටත්ව 2007 ජුනි 28 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයක් ගෙන තිබුණි. චක්‍රීය අරමුදල සඳහා රු.මිලියන 37.5 ක් නැගෙනහිර නවෝදය යටතේ මණ්ඩලයට ලබා දී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීම නිසා ඉඩම 2011 සැප්තැම්බර් 01 දින සමාගමට නැවත පවරා තිබුණද චක්‍රීය අරමුදලේ එදිනට පැවති රු.17,549,341 ක මුදල භාණ්ඩාගාරයට නොයවා 2013 දෙසැම්බර් 31 දක්වාම මණ්ඩලය විසින් රඳවාගෙන තිබුණි.

**4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

නිකවැරටිය ගොවිපලේ අලෙවිසැල රු.9,078,084 ක් වැයකර ඉදිකර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කොන්ත්‍රාත්තුවට අදාල ටෙන්ඩර් මණ්ඩල තීරණ විගණනයට ඉදිරිපත් නොවූ අතර, 2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9 ප්‍රකාරව ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු

සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද මේ සම්බන්ධ වූ ගෙවීම් ඉංජිනේරුවරයෙකු සහතික කර නොතිබුණි.

(ආ) ඉදිකිරීමේ කොන්ත්‍රාත් වටිනාකම රු.6,064,321 වුවද රු.3,013,763 ක් වූ අතිරේක වැඩ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) මාර්ගෝපදේශ 5.4.4 ප්‍රකාරව සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයක් දක්වා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගෙවිය හැකි නමුත් එම සීමාව ඉක්මවා රු.6,319,900 ක් එනම් සියයට 87 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 602 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 486 ක් විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළ වන ජ්‍යෙෂ්ඨ හා ද්විතියික මට්ටමේ තනතුරු පිළිවෙලින් 20 ක් හා 52 ක් සහ තෘතීයික මට්ටමේ තනතුරු 44 ක්ද පුරප්පාඩුව පැවතුණි.

(ආ) බඳවා ගැනීමේ කාර්යය පරිපාටියට අනුව සහකාර කළමනාකරු (අභ්‍යන්තර විගණක) තනතුරට අදාල සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණු වයස අවුරුදු 60 ඉක්මවා තිබුණු නිලධාරියෙකු කළමනාකරු (අභ්‍යන්තර විගණක) ලෙසද, වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් දෙදෙනෙකු මණ්ඩලයේ උපදේශක වරුන් ලෙසද සේවයේ යොදවාගෙන සමාලෝචිත වර්ෂයේදී රු.760,750 ක් ගෙවා තිබුණු නමුත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් පත්කළ ගැටළු විසඳා ගැනීමේ කමිටු නිර්දේශය අනුව 2011 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිලධාරීන් 36 දෙනෙකු සඳහා නව වැටුප් සංශෝධනයක් සිදුකර තිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණු ගොවිපල 16 ක ක්‍රියාකාරකම් 76 ක ඉලක්කයන් හා වාර්ෂික ප්‍රගති සමාලෝචන වාර්තාවෙහි දක්වා තිබුණු එම ඉලක්කයන් අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය. එම නිසා වාර්ෂික කාර්යසාධනය ක්‍රියාකාරී සැලැස්මට අනුව පරීක්ෂා කිරීමට අපහසු වී තිබුණු අතර, පරීක්ෂා කරන ලද තොතුරු අනුව ගොවිපල 14 ක ක්‍රියාකාරකම් 54 ක කාර්යසාධනය ඉලක්කගත වටිනාකමින් සියයට 50 කට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ගොවිපලවල් 14 ක ක්‍රියාකාරකම් 22 කට අදාළව ප්‍රගති සමාලෝචන වාර්තාවේ ඉලක්කගත සංඛ්‍යා අඩුවෙන් දක්වා තිබුණු අතර, එම ඉලක්කයන් ද සමාලෝචිත වර්ෂයේදී ඉටුකර නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

**2013 වර්ෂය සඳහා සකස්කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ඊට අනුකූලවද කටයුතු කර නොතිබුණි.**

**5.3 අයවැය පාලනය**

**අයවැය දත්ත හා තථ්‍ය දත්ත අතර විචලනයේ ප්‍රතිශතය සියයට 08 සිට සියයට 561 දක්වා වූ අතර, 2013 වර්ෂයේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කර නොතිබියදී වැය විෂයයන් 34 ක් සඳහා රු. 66,394,469 ක වියදමක් ප්‍රධාන කාර්යාලයෙන් හා ව්‍යාපෘති මඟින් දරා තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.**

**5.4 නොවිසඳී ඇති විගණන ඡේද**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) රිදීයගම ගොවිපලෙන් අක්කර 150 ක් 2001 වර්ෂයේදී පුද්ගලයින් 98 දෙනෙකු විසින් අනවසර වගා කටයුතු සඳහා අත්පත් කරගෙන තිබුණු අතර ඔවුන් ගොවිපලෙන් ඉවත් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.**

**(ආ) 1992 වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු පොළී රහිත රු.50,000,000 ක ණය මුදල සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි.**

**6. පද්ධති හා පාලනයන්**

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් මණ්ඩලයේ විශේෂ අවධානය යොමුකළ යුතු වේ.**

**(අ) අයවැය පාලනය**
**(ආ) ස්ථාවර වත්කම්**
**(ආ) කොන්ත්‍රාත් පරිපාලනය**
**(ඇ) ණයගැති හා ණයහිමි පාලනය**
**(ඈ) මෙහෙයුම් කළමනාකරණය**
**(ඉ) මූල්‍ය කළමනාකරණය**
**(ඊ) කාර්යමණ්ඩල පරිපාලනය**